

# ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා 272 කින් යුත් ශාඛා ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## රියදුරු පුරප්පාඩු

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි රියදුරු පුරප්පාඩු සඳහා අයදුම් කිරීමට බර වාහන හා සැහැල්ලු වාහන පැදවීමේ බලපත්‍ර සහිතව පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

## මූලික සුදුසුකම්

- අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් විය යුතුය.
- රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් රියදුරෙකු ලෙස වසර 05ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
- සුදුසු මානසික හා කායික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට කැමති අයෙකු විය යුතුය.
- වයස : අවුරුදු 40 ට අඩු විය යුතුය.

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

රිය පැදවීමේ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.

## වැටුප්

තෝරාගන්නා ලද අයදුම්කරුවන්ට ආකර්ෂණීය වැටුප් පරිමාවක් හිමි වේ.

## අයදුම් කිරීම සඳහා අවසන් දිනය

2024 මාර්තු 15

## අයදුම් කළ යුතු ආකාරය

මෙම තනතුර සම්බන්ධව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික/ වෘත්තිමය සහතිකපත්වල සහතික කරන ලද පිටපත් සහ රියදුරු බලපත්‍රයෙහි ඡායා පිටපතක්ද සහිතව ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පතෙහි නම, ලිපිනය, දුරකථන අංකය සහිතව ඥාතීන් නොවන වෘත්තිමය පුද්ගලයන් දෙදෙනෙකුගේ තොරතුරුද ඇතුළත් කළ යුතු අතර අයදුම්කරන තනතුර අයදුම්පත්‍රය බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 03 54 54 | www.rdb.lk